# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1763/21 – 2012 ජුනි 21 වැනි බ්‍රහස්පතින්දා – 2012.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බසියාවත්ත (මීගමුව මහ නගර සීමාව තුළ උප කොට්ඨාසය) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/මීග/2007/483 හා 2008.12.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1, 2, 3 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0133ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස් 3ට මායිම්:

01. **කැබලි අංක 01 – කඩොල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0021 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මීගමුව කලපුව; නැගෙනහිරට: මීගමුව කලපුව; දකුණට සහ බටහිරට: මාර්ගය.

02. **කැබලි අංක 02 – කඩොල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0107 ක් පමණ**

උතුරට: මාර්ගය සහ මීගමුව කලපුව; නැගෙනහිරට: මීගමුව කලපුව සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ මාර්ගය.

03. **කැබලි අංක 03 – කඩොල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0005 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: මේරි විවියන් හිමිකම් කියන ඉඩම සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: LD/05/2006/PC/206.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මීග/3/අත්/155.
2012 ජුනි මස 20 වැනි දින,
අංක 1200/6,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 158